## තැපැල් ඡන්දය සාමකාමීයි

# සියයට 70 ක් ඡන්දය දීලා

(රන්ජන් කස්තූරි)

ජනාධිපතිවරණයේ තැපැල් ඡන්දය විමසීමේ පළමු දිනය වූ ඊයේ (23) ඡන්ද දායකයන්ගෙන් සියයට 70 ක් පමණ ඡන්දය ප්‍රකාශ කර තිබිණි යැයි මැතිවරණ මහලේකම් කාර්යාල ආරංචි මාර්ගවලින් පැවසේ.

සමස්තයක් ලෙස තැපැල් ඡන්ද විමසීම සාමකාමී මට්ටමක පැවැති බව ද මැතිවරණ මහලේකම් කාර්යාලය කීය.

මෙවර තැපැල් ඡන්දය ප්‍රකාශ කිරීමට රජයේ සේවකයන් 541831 ක් සුදුසුකම් ලැබූහ..

අද (24) දිනයේදීත් තැපැල් ඡන්දය විමසීම සිදු කෙරේ.

මේ අතර නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා ජනතා ක්‍රියාකාරිත්වය හෙවත් පැෆරල් සංවිධානය සඳහන් කරනුයේ පළමු දිනයේ දී තැපැල් ඡන්දය භාවිත කිරීම ප්‍රශස්ත මට්ටමක පැවතී බවය.

තැපැල් ඡන්දය සාමකාමීව පැවැති අතර එක් ගැටුමක් පමණක් ත්‍රිකුණාමලය ගෝමරන්කඩවලින් වාර්තාවී තිබූ බවද පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා පැවැසීය.

තැපැල් ඡන්දය ප්‍රකාශ කිරීම ඊයේ දිනත් අම්පාර දිස්ත්‍රික්කයේ අනියම් හා ආදේශක කම්කරුවන්ට ස්ථිර පත්වීම් ලබාදීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ රැස්වීමක් සූදානම්කර තිබූ නමුත් සහකාර මැතිවරණ කොමසාරිස්වරයාගේ මැදිහත්වීමෙන් එය නතර කර තිබෙන බවද පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂකවරයා සඳහන් කරයි.